**තුරුසවිය අරමුදල - 2021**

**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

තුරුසවිය අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන _ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ පිරිවැය එකතුව රු.1,548,645 ක් වූ පරිගණක, කාර්යාල උපකරණ, කාර්යාල ලීබඩු හා යන්ත්‍රෝපකරණ තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 92 ඡේදය ප්‍රකාරව ඵලදායී ජීවිත කාලය සලකා බලා ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් වත්කම්වල ඵලදායි ජීවිතකාලය සලකා බලා ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගත යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ලෙස රු. 16,844,125 ක් ලැබී තිබුණු නමුත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.18,000,000 ක් ආදායම ලෙස හා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස රු.1,155,874 ක් දක්වා තිබුණද, මෙම වටිනාකම උපලබ්ධි නොවන වටිනාකමක් විය. | අප ආයතනය විසින් වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු.18,000,000 ඉල්ලුම් කර ඇත. තවද, භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ ජනරාල් (රාජ්‍ය ව්‍යාපාර කටයුතු) විසින් අනුමත කර ඇත. එමෙන්ම අයවැයෙන් අප ආයතනයේ ප්‍රාග්ධන වියදම සඳහා අනුමත මුදල වී ඇත්තේ ද රු.18,000,000 වේ. මේ හේතුවෙන් ලැබිය යුතු මුදල උපචිත සංකල්පයට අනුව උපචිත ආදායමක් සේ ගිණුම් ගත කර ඇත. | මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ලෙස ලැබුණු වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ තුරුසවිය කුඩා රබර් වතු හිමියන්ගේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ මිලදී ගෙන තිබුණු කිරි මුදවන ඇලුමිනියම් තැටි, රබර් කිරි එකතුකරන ප්ලාස්ටික් කෝප්ප සහ කෝප්ප රඳවන දෙසැම්බර් 31 දිනට තොග ලේඛනයේ පිළිවෙලින් ඒකක 248 ක් 73,628 ක් සහ 63,195 ක් ඉතිරිව පැවතිණි. කෙසේවුවද, රු. 2,652,715 ක් වූ එම ඒකකවල මුළු වටිනාකම දෙසැම්බර් 31 දිනට අවසන් තොගයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු නොකර වියදම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගලපා තිබුණි. | මෙම භාණ්ඩ 2021 වර්ෂයට අදාළව මිලදී ගැනීම සිදුකර ඇති බැවින් මෙලෙස ඉතිරි තොග පවත්වා ගැනීම මූල්‍ය කාර්ය සාධනයට සහ එහි ප්‍රගතියට බලපෑම් කරන බැවින් සහ එම තොග මුදල් ගෙවා මිලදී ගෙන ඇති නිසාවෙන් රජයේ වියදම අඩුවෙන් වාර්තා නොවන ආකාරයට ලබාදී ඇති උපදෙස් වලට අනුකූලව ගිණුම් ගත කර ඇත. | බෙදා නොහළ භාණ්ඩ මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොග වශයෙන් දැක්විය යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂය තුළ අරමුදල වෙත ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබුණු මෝටර් රථ 7 ක වටිනාකම එම වර්ෂය තුළදී වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබියදීත්, මෝටර් රථ ක්ෂය වෙන්කිරීම් ආරම්භක ශේෂය වශයෙන් රු.40,000 ක් හා ඒම වටිනාකම සමුච්චිත අරමුදලේ ආරම්භක ශේෂයට ගලපා තිබුණි. | මෙම මෝටර් රථයට අදාළ පිරිවැය වත්කම් ගිණුමට 2021 වර්ෂයේදී ඇතුළත් කර 2021 වර්ෂයට අදාළ ක්ෂය නිවැරදිව 2021 වර්ෂයේ වියදම් ගිණුම් වලට ඇතුළත් කර ඇත.මෙය 2020 වර්ෂයේ දෙසැම්බර් මස ප්‍රත්‍යාගණය කරන ලද වත්කමක් බැවින් 2020 වර්ෂයේ පොත්වල වාර්තා විය යුතුව තිබුණි. මෙය පොත් තබන්නාගේ මග හැරීමක් සිදු වී ඇති හෙයින් මෙය 2021 වර්ෂයේ නිවැරදි කර ඇත. | ඉකුත් වර්ෂයේ මෝටර් රථ ගිණුම්ගත නොවීම නිසා ක්ෂය ගැලපීම් සිදුනොකළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

---------------------------------

**1.6.1 ලැබිය යුතු මුදල්**

-----------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කළුතර, කෑගල්ල, රත්නපුර සහ ගම්පහ යන දිස්ත්‍රික්ක 04 හි තුරුසවිය සමිති 30 ක් සඳහා බිම් තරාදි, රබර් ඩයමන්ඩ් රෝල් මිලදී ගැනීම වැනි කාර්යයන් සඳහා දෙනලද ණය මුදල්වලින් රු.826,109 ක් වූ ලැබිය යුතු ශේෂයක් වර්ෂ 05 ක කාලයකට වඩා පැවති නමුත් අයකර ගැනීමට | මේ සම්බන්ධයෙන් හතර වතාවක් පමණ එන්තරවාසි හා නෛතික දැනුවත් කිරීම් කර ඇති අතර, එම මුදලින් වැඩිමනත්ව ප්‍රමාණය අය කර ගැනීමට හැකියාව උදාවුවත්, අදාළ විගණන විමසුමේ සඳහන් ශේෂගත මුදල මේ දක්වා අයකර ගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව නැවත | ණය අයකර ගැනීම සඳහා පියවර ගත යුතුය. |

| | |
|---|---|
| නොහැකිව පැවතිණි. එසේම මෙම සමිති සමාලෝචිත වර්ෂය වන විට සක්රිය මට්ටමේ පවතින්නේද යන්න තහවුරු කර ගෙන නොතිබුණි. | වාරයක් ඒ සම්බන්ධයෙන් උත්සහ දැරීමට හෝ බොල්ණය ලෙස කපා හැරීමට කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කිරිමට අපේක්ෂා කෙරේ . |

1.7 **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 2008 මාර්තු 03 දිනැති අංක 1/2008 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්රලේඛය | රාජ්‍ය බැංකුවල කළ ආයෝජන කල් පිරුන විට නැවත ආයෝජනය කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව හා භාණ්ඩාගාරය විසින් මැදිකාලීන ආයෝජන සඳහා ගෙවනු ලබන පොලී අනුපාතයට යටත්ව වසර දෙකකට හෝ ඊට වැඩි කාලපරිච්ජේදයක් සඳහා වන බැංකු තැන්පතු හෝ භාණ්ඩාගාර බැඳුම්කරවල වුවද, 2017 වර්ෂයේ සිට මාස 06 ක කෙටිකාලීන තැන්පතුවල රාජ්‍ය බැංකුවක කර තිබුණු ආයෝජනවල වටිනාකම 2021 දෙසැම්බර් 31 දිනට රු.9,656,585 ක් විය. | මෙය 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමින් දැනටමත් පවතී. | භාණ්ඩාගාරය විසින් නිකුත් කරන චක්රලේඛ විධිවිධාන වලට අනුව මුදල් ආයෝජනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,543,063 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,222,288 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.320,775 ක වර්ධනයක් පෙන්නුම් කරන කෙරුණි. මෙම වර්ධනයට අරමුදලේ දුම් ගෙවල් සහනාධාර ව්‍යාපෘති වියදම රු.9,963,463 කින් වැඩි වුවද, රජයේ ප්‍රදාන ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 11,133,916 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ කිරිකැපුම් පිහි මිලදී ගැනීම සඳහා රු.1,700,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණු නමුත් පිහි මිලදී නොගැනීම නිසා එම ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරිව පැවතිණි. එසේම තුරුසවිය සමිති 15 කට කිරි කැපුම් පිහි 894 ක් ලබාදීමට තුරුසවිය සමිති සාමාජිකයන් 15 දෙනෙකුගෙන් රු.377,715 ක් ලබාගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගැනීම් සිදුනොවීම හේතුවෙන් එම සාමාජිකයන් වෙත 2022 මැයි මාසය තෙක්ම පිහි ලබාදීමට නොහැකිව තිබුණි. | 2021 ක්‍රියාකාරී සැලැස්ම යටතේ කිරිපිහි 4000 ක් මිලදී ගැනීම සඳහා සැපයුම්කරු සමඟ ගිවිසුම් අත්සන් කර තිබූ නමුත්, ඔහු ඉන්දියාවෙන් එම කිරිපිහි ප්‍රමාණය ගෙන්වීමට කටයුතු කර තිබූ නිසා රටේ ඩොලර් ප්‍රශ්නය නිසා ඔහුට නියමිත දිනට කිරිපිහි සැපයිය නොහැකි බව දන්වා තිබුණි. ඒ නිසා කිරිපිහි ගෙන්වීම ප්‍රමාද වී ඇත. | සැලසුම් අනුව මිලදී ගැනීම් සිදුකර නියමිත පරිදි බෙදාහැරීම් සිදුකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ තුරුසවිය සමිති සඳහා සියයට 50 ක සහනාධාර ක්‍රමයට රබර් කිරි මුදවන ඇලුමිනියම් තැටි ලබාදීමේ වැඩ සටහන යටතේ තැටි 7000 ක් රු.4,191,250 කට මිලදී ගෙන තිබුණි. එහිදී තුරුසවිය සමිති සාමාජිකයන් 21 දෙනෙකු විසින් තැටි 6,752 ක් සඳහා රු.2,021,925 ක් අරමුදලට ගෙවීම් කර තිබුණි. කෙසේවුවද අරමුදල විසින් තැටි 2777 ක් පමණක් බෙදාහැර ඉතිරි තැටි 4223 ක් 2022 මැයි මාසය දක්වාම ගබඩාවේ රඳවාගෙන තිබුණි. | සියයට 50 සහනාධාර පදනම මත රබර් ගොවීන් (තුරුසවිය සමිති සාමාජිකයින්) වෙනුවෙන් ලබාගත් රබර් කිරි මුදවන ඇළුමිනියම් තැටි 7,000 ක ප්‍රමාණය සඳහා මුදල් මේවන විට ගොවින්ගෙන් අයකර ගෙන ඇත. ඒ අනුව මුළු තැටි 7,000 ක ප්‍රමාණයෙන් 6,219 ක් දිස්ත්‍රික්ක වල තුරුසවිය සමිති සාමාජිකයින් වෙත බෙදා දී ඇති අතර, ඉතිරි ප්‍රමාණය ඉදිරි මස තුළ ප්‍රතිලාභින් සඳහා බෙදා දීමට කටයුතු කරන බව දන්වමි. | සහනාධාර පදනමට ලබාගත් උපකරණ අප්‍රමාදීව බෙදා දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ වෘත්තීය කිරිකැපුම් ශිල්පීන් පුහුණු කිරීම සඳහා රු.1,400,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු නමුත් පුහුණු වැඩසටහන් පැවැත්වීමට අදාළ වූ දිස්ත්‍රික්ක සහ සහභාගි කර ගැනීමට අපේක්ෂිත ශිල්පීන් සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. ඉකුත් වර්ෂයේ සැලසුම්කළ නමුත් ක්‍රියාත්මක කිරීමට නොහැකිවූ පුහුණු වැඩසටහන් 03 ක් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණි. කෙසේවුවද එම පුහුණු වැඩසටහන් වලට සහභාගීවන ශිල්පීන්ට ලබාදීමට ඉකුත් වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු රු.685,474 ක් වටිනාකමැති විදුලි පන්දම්, මෙවලම් මළු, ටීෂර්ට්,පිහි,ටේප් සහ අනෙකුත් මෙවලම් උපකරණ එම පුහුණු අවස්ථාවේදී බෙදා නොදීම හේතුවෙන් 2022 මැයි මාසය දක්වාම ගබඩාව තුළ පැවතුණි. | රටතුළ පැවති අයහපත් වාතාවරණය යටතේ සැලසුම් කළ පරිදි පුහුණුලාභීන්ගේ සහතික පත්‍ර හා උපකරණ කට්ටලය බෙදාදීමට නොහැකි විය. මෙවන විට සාර්ථකව පුහුණුව අවසන් කරන ලද සියළුම පුහුණුලාභීන් සඳහා උපකරණ කට්ටලය සහ සහතික පත්‍ර බෙදාදීම සිදුකර ඇති බව දන්වා සිටිමි. | අපේක්ෂිත පුහුණු වැඩසටහන් පිළිබඳ සියලු විස්තර සහිතව සැලසුම් සකස් කළ යුතුය.මිලදීගත් උපකරණ පුහුණු අවස්ථාවේදීම බෙදාදිය යුතුය. |
| (ඈ) | තුරුසවිය අරමුදල යටතේ දිස්ත්‍රික්ක 16 ක තුරුසවිය සමිති 844 ක් ලියාපදිංචි කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ඉන් සමිති 293 ක් අක්‍රීය තත්ත්වයේ පැවතිණි. | පසුගිය වර්ෂ කිහිපය පුරාම ඇතැම් ප්‍රදේශ වල රබර් වගාව ඉවත් කරමින් වෙනත් බෝග වෙත යොමු වීම, නාගරීකරණය නිසා රබර් ඉඩම් ගලවා දැමීම වැනි හේතු නිසා ඇතැම් සමිති වල සාමාජිකයින්ගේ ප්‍රමාණය අඩුවීම සමඟ එම සමිති වල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ගැටළු පැන නැගී ඇත. එහෙත් ඉදිරියේදී එසේ පවතින සමිති ප්‍රතිසංවිධානය සිදු කර ඒකාබද්ධ කරමින් ක්‍රියාකාරි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | අක්‍රීය සමිති සක්‍රීය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2020 වර්ෂය තුළදී ජනාධිපති ලේකම් කාර්යාලයෙන් අරමුදල වෙත ලැබුණු අංක 65 -0681 දරන ජීප් රථය අලුත්වැඩියා කිරීමට ඉකුත් වර්ෂයේ නොවැම්බර් මාසයේ කොළඹ ප්‍රදේශයේ අනුමත පෞද්ගලික ගරාජයකට ලබාදී තිබුණු අතර 2022 මැයි මාසය දක්වාම එම රථය අලුත්වැඩියාව නිමකර රැගෙනවිත් නොතිබුණි. | 2020 නොවැම්බර් මස අලුත්වැඩියාව සඳහා ගරාජය වෙත භාරදී තිබුණු 65-1090 දරන ජීප් රථය නැවත අලුත්වැඩියා කර 2021 ඔක්තෝබර් මස ආයතනය වෙත භාර දී ඇති අතර, එහි හටගත් දෝෂයක් නිසා හා රියදුරුවරුන් මෙහි දෝෂයක් ඇති බව සඳහන් කළ නිසාවෙන් නැවත ගරාජය වෙත භාරදුන්නේය. එහිදී ගෙවීම් නතර කිරීමට උපදෙස් ලබාදුන් අතර, නැවත රථය ආයතනය වෙත භාර නොදී ගරාජයේ තබා ගෙන ඇත. | අප්‍රමාදව අලුත්වැඩියා කටයුතු සිදු කරවා රථය ධාවනයට යෙදවිය යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ ජනවාරි මාසයේ අරමුදල වෙත ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබුණු රු.2,000,000 ක් වටිනාකමැති අංක KW 3039 දරන කාර් රථය ධාවනය කිරීමට නොහැකිවීම මත වර්ෂ දෙකකට වැඩි කාලයක් නිශ්කාර්යව පැවතිණි. | අදාළ වාහනය අලුත්වැඩියා කිරිම සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන්කර නොතිබු බැවින් එය අලුත්වැඩියා කිරිමට නොහැකිව ඇත. | වාහනය අලුත්වැඩියා කළ යුතුය. |